# හෙළවදන

## නවයුගය



**Microimage**
**10 yrs. of language solutions**

## නව යුගයක ආරම්භය.......

**1993 වර්ෂයේ දී උසස් පෙළ සිසුන් කීප දෙනෙකු එක්වී එක් සුවිශේෂ කර්තව්‍යකට මුල පිරීය. ඒ එකල රටට අලුත් දෙයක්ව තිබූ පරිගණක මෘදුකාංග නිපදවීම කෙරෙහිය. මෙහි විශේෂත්වයක් වූයේ සිංහල බසින් ක්‍රියාත්මක වන මෘදුකාංග නිෂ්පාදනය කෙරෙහි ඔවුන්ගේ ඇස යොමුවී තිබීමයි. ඉංග්‍රීසි බස දන්නා අයට පමණක් පරිගණක භාවිතා කිරීමට හැකිව තිබූ මෙම යුගයේ මෙම ශිෂ්‍යන්ගේ උත්සාහය සමහර විද්වතුන්ගේ හාස්‍යයට ද ලක් විය. මේ කිසිවකින් නොසැලුන මෙම අධිෂ්ඨානශීලී සිසුන්ගේ උත්සාහය මල් පල ගැන්වුනේ "මයික්‍රෝ ඉමේජ්" (Microimage) නම් ආයතනය පිහිටුවා සිංහලෙන් වැඩ කළ හැකි මෘදුකාංග පෙළක් එළිදැක්වීමෙනි.**

අද වන විට සිංහල භාෂාවෙන් වැඩ කළ හැකි මෘදුකාංග කීපයක් විවිධ ආයතන මගින් එළිදක්වා ඇතත් යුනිකෝඩ් කේතයට අනුකූලව අංග සම්පූර්ණ මෘදුකාංගයක් තිකුත් කළේ තම ආයතනය බව හර්ෂ පූරසිංහ මහතා පවසයි.


හර්ෂ පූරසිංහ මහතා ද පෙර කී සිසුන් කීප දෙනාගෙන් කෙනෙකි. අද ඔහු ඔවුන් විසින් ම පිහිටුවාගත් 'මයික්‍රෝ ඉමේජ්' ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා ය. ඔහු සමග සිටි අනෙකුත් සිසුන්ද තවමත් එම ආයතනයේ විවිධ තනතුරු දරමින් නවතම මෘදුකාංග එළිදැක්වීමට උත්සාහ ගනිමින් සිටී.


අද බොහෝ පුවත් පත් ආයතන, ප්‍රකාශන සමාගම් මෙන්ම ග්‍රැෆික් නිර්මාණ කරණයේ යෙදෙන්නන් ද භාවිතා කරන සිංහල යතුරු පුවරු මෘදුකාංගයක් වන 'හෙළවදන' ඔවුන්ගේ උත්සාහයේ අනගි ප්‍රතිඵලයකි.

1994 දී එළිදක්වන ලද මෙම හෙළවදන සිංහල භාෂා මෘදුකාංගය කෙතරම් ජනප්‍රිය දැයි පවසනොත්, එහි ඇති විවිධ අකුරු රටාවන් නොමැති සඟරාවක් හෝ පොතක් සොයා ගැනීමට පවා දුෂ්කරය.

එනෙක් පැවති සිංහල යතුරු පුවරුවල පැවති දෝෂයක් වූයේ ඉස්පිලි හා පාපිලි යෙදීමේදී ඒවා සිංහල භාෂාවේ සම්මත රටාවට සකස් නොවීමයි. එහෙත් 'හෙළවදන' මෙම දෝෂය සම්පූර්ණයෙන්ම මග හැරීමට කටයුතු කර ඇත. එමෙන්ම සම්මත අකුරු රටාවන්ගෙන් මිදී විවිධ හැඩයන්ගෙන් යුත් අකුරු රටාවන් හඳුන්වා දීමට ද ඔවුන් උත්සාහ ගෙන තිබිණි.











> විවිධ සිංහල භාෂා මෘදුකාංග භාවිතයේදී මුහුණ දුන් තවත් ගැටළුවක් වූයේ එම මෘදුකාංග නිපදවන්නන් විසින් පොදු සම්මත රීතියක් භාවිත නොකිරීමයි. සමහරු විජේසේකර යතුරු පුවරුව භාවිතා කලත් තවත් අය භාවිතා කළේ ස්වාරානුකූල යතුරු පුවරුවයි. මේ නිසා එක් පරිගණකයක සැදූ ලිපියක් වෙනත් පරිගණකයකින් විවෘත කිරීමේදී හා සංස්කරණය කිරීමේදී බොහෝ ගැටළු පැන නැගුනි. පරිගණක ආශ්‍රිතව සිංහල භාෂාවෙන් කටයුතු කිරීමේදී මෙවන් ගැටළු පැන නැගීම ගැන රජයේ ද අවධානය යොමු විය.

මෙසේ සිංහල භාෂා යතුරු පුවරු එළිදැක්වුවත්, සිංහල භාෂාවේ අකුරු මුද්‍රිත යතුරු පුවරු නිෂ්පාදනය කර නොමැති වීම බලවත් ප්‍රශ්නයක් විය. මේසඳහා ද 'මයික්‍රෝ ඉමේජ්' ආයතනය විසඳුමක් ඉදිරිපත් කරන ලදී. ඒ 2000 වර්ෂයේදී එළිදක්වන ලද ස්වාරානුකූල (Phonetic) යතුරු පුවරුව මඟින්ය. මෙම යතුරු පවුරුව මඟින් ඉතා පහසුවෙන් ඉංග්‍රීසි යතුරු පුවරුව ආශ්‍රයෙන්ම සිංහල අකුරු යතුරු කිරීමට හැකි වේ. උදහරණයක් වශයෙන් "මම ඔබ එනතුරු බලා සිටිමි" යන්න යතුරු කිරීමට අවශ්‍ය නම් ඔබ කළ යුත්තේ, ඉංග්‍රීසි යතුරු පුවරුවෙන් "mama oba Anathuru balaa sitimi" යන්න යතුරු කිරීම පමණි. මේ සඳහා සිංහලෙන් මුද්‍රිත යතුරු පුවරුවක් අවශ්‍ය නොවීම විශේෂත්වයකි.

විවිධ සිංහල භාෂා මෘදුකාංග භාවිතයේදී මුහුණ දුන් තවත් ගැටළුවක් වූයේ එම මෘදුකාංග නිපදවන්නන් විසින් පොදු සම්මත රීතියක් භාවිත නොකිරීමයි. සමහරු විජේ-




සේකර යතුරු පුවරුව භාවිතා කලත් තවත් අය භාවිතා කළේ ස්වාරානුකූල යතුරු පුවරුවයි. මේ නිසා එක් පරිගණකයක සැදූ ලිපියක් වෙනත් පරිගණකයකින් විවෘත කිරීමේදී හා සංස්කරණය කිරීමේදී බොහෝ ගැටළු පැන නැගුනි.

පරිගණක ආශ්‍රිතව සිංහල භාෂාවෙන් කටයුතු කිරීමේදී මෙවන් ගැටළු පැන නැගීම ගැන රජයේ ද අවධානය යොමු විය. සිංහල අකුරු භාවිතයේදී සම්මතයක් ඇති කිරීම සඳහා රජය මගින් ICTA ආයතනයට බලය පවරන ලදී. මෙහි මූලික අරමුණ වූයේ යුනිකෝඩ්(Unieode) කේතයට අනුව සිංහල අක්ෂර ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස් කිරීමය. 'මයික්‍රෝ ඉමේජ්' ආයතනයද මේ සඳහා පුළුල් අයුරින් දායක විය. මෙම කර්තව්‍ය අවසන් වූයේ යුනිකෝඩ් කේතයට අනුකූල සිංහල අක්ෂර රටාවක් පසුගිය වසරේදී හඳුන්වා දීමත් සමගය.

මෙම හඳුන්වාදීමත් සමගම බොහෝ සිංහල මෘදුකාංග නිපදවන්නන් ද මෙම කේතයට අනුකූල ලෙස තම මෘදුකාංග නැවත සැකසීමට උනන්දු විය. මේ අනුව 'මයික්‍රෝ ඉමේජ්' ආයතනයද යුනිකෝඩ් සම්මතයට අනුකූල නවතම සිංහල භාෂා මෘදුකාංගයක් හඳුන්වාදීමට උත්සුක විය.

මෙම වසර මැද භාගයේදී හඳුන්වා දුන් "හෙළවදන නවයුගය" එම මෘදුකාංගයයි. මෙය තවත් එක් සිංහල මෘදුකාංගයක් පමණක්ම නොවේ. එය මෙතෙක් කිසිවකු අත් නොවිඳි කාර්ය භාරයන් සමූහයක් ඉටු කර ගත හැකි සුවිශේෂ මෘදුකාංගයකි. යුනිකෝඩ් අකුරු භාවිතය, ප්‍රමිති නොකරන ලද අකුරු යුනිකෝඩ් අකුරු බවට පරිවර්තනය කිරීමේ හැකියාව, විවිධ වැඩසටහන්, උපාංග, පරිගණක ක්‍රීඩා සහ සුවිශේෂී ස්වයං අධ්‍යාපනික මෘදුකාංග මඟින් මෙය බලගැන්වී ඇත. මෙවැනි සුවිශේෂී අංගයන් අඩංගු යුනිකෝඩ් සම්මතයට අනුකූල එකම සිංහල භාෂා මෘදුකාංගය මෙම 'හෙළවදන නවයුගය' බව 'මයික්‍රෝ ඉමේජ්' හි අධ්‍යක්ෂ හර්ෂ පුරසිංහ පවසයි.

මෙම මෘදුකාංගය ඔබේ පරිගණකයේ පිහිටුවීමට නම් අවශ්‍යතා කීපයක් සම්පූර්ණ කර ගත යුතු වේ. පෙන්ටියම් III 128 මෙගා බයිට් මතකයක් හා 300 මෙගා බයිට් හිස් ඉඩක් සහිත එමෙන්ම වින්ඩෝස් 200 ට හෝ XP මෙහෙයුම් පද්ධතියකින් ඔබේ පරිගනකය සමන්විත වීම මේ සඳහා තිබියයුතු අවම සුදුසුකම් වේ.

මෙම මෘදුකාංගය ඔබේ පරිගණකයේ භාගත කළ පසු පරිගණක තිරයේ ඉහළින්ම දිස් වන්නේ 'හෙළ වදන නවයුගය' හි සියළු ක්‍රියාකාරකම් සඳහා ආරම්භය ලබා දෙන පිවිසුම් තලයයි. මෙහි අකුරු, යතුරු පුවරුව, උපාංග, වැඩසටහන් හා දැනුම යනුවෙන් සඳහන් අයිකන දක්නට ඇත. මෙම එක් එක් අයිකන සක්‍රිය කිරීම මගින් ඔබට මෙහි ඇති සුවිශේෂ අංගයන් තුළට ගමන් කළ හැකි වේ.

දැන් අපි බලමු මෙම අයිකන තුළ සැඟවී ඇති සුවිශේෂී කාර්යයන් මොනවාද කියා.


මෙහි මුලින්ම ඇති "අකුරු" යන්න සඳහන් අයිකනය සක්‍රිය කළ පසු පරිගණකයේ ඇති සියළුම සිංහල අකුරුවල හැඩය මෙන්ම එහි ප්‍රමාණයද පහසුවෙන් දැක ගත හැකි වේ.

1. සාමාන්‍ය ඉංග්‍රීසි
2. යුනිකෝඩ් අනුකූල සිංහල
3. යුනිකෝඩ් විජේසේකර
4. සාමාන්‍ය ස්වාරානුකූල
5. සාමාන්‍ය විජේසේකර

යන ක්‍රියාකාරකම් "යතුරු පුවරු" අයිකනය සක්‍රිය කිරීමෙන් දැක ගත හැක. මෙමගින් ඔබට කැමති පහසු යතුරු පුවරුවකින් යතුරු කිරීමේ අවස්ථාව සැලසේ.

"උපාංග" යටතේ පහත සඳහන් පහසුකම් ලබා ගත හැකි වේ.

1. **අකුරු පරිවර්තකය** - මෙමගින් වෙළෙඳ පාලේ ඇති වෙනත් අකුරු වර්ග යුනිකෝඩ් ප්‍රමිතියට පරිවර්තනය කර ගත හැක.
2. **වචන පරීක්ෂාව** - මෙය සිංහල අක්ෂර වින්‍යාසයක් වශයෙන් ක්‍රියාත්මක වේ.
3. **සෙවීම හා යෙදීම** - ලිපියක ඇති වචනයක් ඔබේ අවශ්‍යතාව අනුව වෙනත් වචනයකට ස්වයංක්‍රීයව මාරු කර ගත හැකිය.
4. **ලිපි සොයනය** - වින්ඩෝස් හි 'සර්ච්' නැමැති ක්‍රියාකාරකමට සමාන සෙවුම් යන්ත්‍රයකි.




## පින්තූර එකතුව

මෙහි ඇති පින්තූර, අකුරක් මගින් හෝ නමක් භාවිතයෙන් සොයා ගැනීම ප්‍රමාණය වෙනස් කිරීම හෝ වෙනත් ගොනුවකට පිටපත් කිරීම කළ හැක.

'වැඩසටහන්' අයිකනය සක්‍රිය කිරීමෙන් මෙතෙක් ඉංග්‍රීසි භාවිතයෙන් පමණක් කළ හැකිව තිබූ අතිරේක විශේෂාංග ගණනාවක් සිංහලෙන් කළ හැකි වේ. ගණක යන්ත්‍රයක්, දින දසුනක්, පරිවර්තකයක්, දින සැලැස්මක්, ඇලවෙන ඩිජිටල් කොළයක්, යතුරු පුහුණු ක්‍රීඩාවන්, ලෝකයේ වේලාවන් දර්ශනය වන ලෝක ඔර්ලෝසුව ආදිය මෙහි ඇති විශේෂාංග අතර වේ.

මෙම 'හෙළ වදන නවයුගයෙහි' ඇති විශේෂිත අංගයක් වන්නේ 'දැනුම' නමැති අධ්‍යාපනික මෙවලමයි. මෙහි ඇති ගවේෂක නැමති අයිකනය මගින්,MS, Word, Excel, Power Point නමැති ජනප්‍රිය මෘදුකාංග තනිවම ඉගෙන ගැනීමට හැකිවන අයුරින් නිර්මාණය කර ඇත.

සිංහල භාෂාවෙන් සකස්කර ඇති මෙය ශ්‍රව්‍ය දෘෂ්‍ය යන මාධ්‍ය දෙකම උපයෝගී කර ගෙන නිපදවා ඇති බැවින් පත පොතකින් ඉගෙනීමට වඩා ප්‍රතිඵලදායී වේ. එමෙන්ම වින්ඩෝස් XP යනු කුමක්ද යන්නත් යුනිකෝඩ් තේත ක්‍රමය ගැන සරල සිංහලෙන් කියාදීමත් මෙම මෘදුකාංගයේ ඇති විශේෂාංග අතර වේ.

මෙවන් සිංහලෙන් ක්‍රියාකළ හැකි වැඩසටහන් බිහි කළේ ඉංග්‍රීසි නොදන්නා කම නිසා පරිගණකයට බිය වූ එහෙත් දක්ෂතාවලින් පරිපූර්ණ පිරිසක් එල්ල කරගෙන බව හර්ෂ පුරසිංහ මහතා පැවසීය. මෙම 'හෙළ වදන නවයුගය' හඳුන්වාදී ඉතා කෙටි කලක් තුළ ඉමහත් ගැනුම්කරුවන් පිරිසක් එක්වී සිටීම සුබ ලකුණක් බවද ඒ මහතා පැවසීය.

තම ආයතනයේ ඉදිරි සැලසුම් ගැන කරුණු දක්වූ ඒ මහතා, සිංහල භාෂාව පරිගණකයෙන් ඔබ්බට ගොස් ජංගම දුරකතනය දක්වා රැගෙන යාමට තම ආයතනයට හැකිවූ බවද දැනටමත් ඩයලොග් දුරකතන ඔස්සේ සිංහලෙන් ඊ මේල් යැවීමට හැකි බවත් එය තම ආයතනයේ නිර්මාණයක් බවද ළඟදීම ජංගම දුරකතන හරහා කොටස් වෙළෙඳපොළට එබී බැලීමටත්, විනිමය අනුපාත, එදිනෙදා පුවත් පත්වල විස්තර, හඳහන් පලාපල ආදී තවත් දහසකුත් දේ සිංහල බසින් බලාගත හැකි ලෙස නවතම මෘදුකාංගයන් එළිදැක්වීමට අදහස් කර ඇති බවද පැවසීය.

එමෙන්ම තම නිෂ්පාදනවල තත්ත්වය හා ගුණාත්මක භාවය වෙනුවෙන් "BSC National Best Quality Software" රන් හා රිදී සම්මාන 1998, 2000 හා 2004 යන වසර සඳහා ලැබීමෙන් මෙන්ම ඩයලොග්, ලංකා බෙල්, HSBC, DFCC තේමාස්, කාර්ගිල්ස්, මාලදිවයිනේ ධිරාගු ටෙලිකොම් වැනි ආයතන තම ආයතනය කෙරෙහි විශ්වාසය තබා අප හා සම්බන්ධ වී සිටීම ගැන තමා නිහතමානිව ආඩම්බර වන බවද හර්ෂ පුරසිංහ මහතා පවසයි. ❑

\- මොහාන්

